# පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය

පූජ්‍ය ආචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි

ලෝකයේ පැරණිතම අධ්‍යාපන ආයතන සියල්ලක් ම පාහේ ආරම්භ වී ඇත්තේ ආගමික මධ්‍යස්ථාන කේන්ද්‍රකොට ගෙන ය. පෙරදිග ලෝකයේ පැරණි විද්‍යාස්ථාන වූ තක්සිලා, නාලන්දා වැනි විශ්වවිද්‍යාල ක්‍රියාත්මක වූයේ වෛදික ධර්මයත් එය හැදෑරීමට අවශ්‍ය සංස්කෘත භාෂාවත් උගන්වනු පිණිස ය.[1] අපරදිග සමාජයේ කේම්බ්‍රිජ් හා ඔක්ස්ෆර්ඩ් වැනි විශ්වවිද්‍යාල ඒ තරම් ම පැරණි නො වුවත් මුල දී එම ආයතන ක්‍රිස්තියානි දේවස්ථාන හැටියට ක්‍රියාත්මක වී ඇත.[2] ලංකාවේ පැරණිතම අධ්‍යාපන ආයතනය ලෙස සැලකෙන්නේ අනුරාධපුර මහාවිහාරය යි.[3] එය ආරම්භ වී ඇත්තේ ක්‍රි.පූ. තුන්වන සියවසේ දී මිහිඳු ආගමනය සිදු වී නොබෝ කලකට පසුව ය. මහාවිහාරය ථේරවාදී අධ්‍යාපන මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියාත්මක වූ බැවින් බොහෝ විදේශීය භික්ෂූන් වහන්සේලා ථෙරවාදය හැදෑරීම සඳහා මෙරටට පැමිණි බව මහාවංශය ඇතුළු වංසකථා හා අටුවාවන්ගෙන් අනාවරණය වෙයි. මුල දී ලක්දිව ආගමික ආයතන නුදෙක් ආගමික අධ්‍යාපනයට සීමා වුවත් වැඩි කල් නො ගොස් ම ලෞකික විෂයන් වන ආයුර්වේදය වැනි විද්‍යා ශාස්ත්‍ර හා කලා ශිල්ප උගන්වන ස්ථාන බවට පත් විය.[4]

අනුරාධපුර යුගයේ දී ම මෙම ආයතනවල ඉගැන්වෙන විෂය ක්ෂේත්‍රය පුළුල් වීම ආරම්භ වූ අතර රටේ විවිධ ප්‍රදේශවල අධ්‍යාපන ආයතන බිහිවීම ද පටන් ගැනිණ. එකල පැවති ආගමික අධ්‍යාපන ආයතන අටක් ගැන මහාවංසයේ දක්වේ.[5] ඊට අමතරව ද තවත් අධ්‍යාපන ආයතන 38 ක් එකල මෙරට පැවති බව පෙනී යයි. මෙම ආයතනවල අධ්‍යාපන ක්‍රමය පාලි භාෂාව හා බෞද්ධ අධ්‍යාපනය මුල් කර ගත්තකි. භික්ෂූන් වහන්සේ මෙහිලා ප්‍රමුඛ කාර්යභාරයක් දරූවෙති. මෙම ආයතන නුදෙක් ඉගැන්වීමට සීමා නො වූ අතර රටේ සමාජ, ආර්ථික හා දේශපාලනික ගමන්මග නිර්ණය කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සැපයීම ද මේවායින් ම සිදු විය. විශේෂයෙන් මෙරට රජදරුවන් තීරණ ගැනීමේ දී මෙම ආයතනවල විද්වතුන්ගේ මතය විමසා ඇත. එය උල්ලංඝණය වූ අවස්ථාවල පාලන තන්ත්‍රයට එරෙහි වීමට ද මෙම ආයතන ප්‍රධානීහු